# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.06 පැය 2200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/664 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. දිය අනතුරකින් විදේශීය ජාතික කාන්තාවක් බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය හික්කඩුව.**

2025.04.06 වන දින සවස් කාලයේ හික්කඩුව පන්නම්ගොඩ වෙරළ තීරයේ දියනෑමට ගිය විදේශීය ජාතික කාන්තාවක් දිය වැලකට හසුවී මුහුදට ගසාගෙන යමින් සිටියදී එම ස්ථානයේ රාජකාරී යෙදී සිටි හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් පරික්ෂක හේවගේ, උප පොලිස් පරික්ෂක සිරිමල්, පොලිස් කොස්තාපල් 96221 දුමින්ද සහ පොලිස් කොස්තාපල් 27794 බණ්ඩාර යන නිලධාරීන් විසින් ඇයව බේරාගෙන ඇත.

**අනතුරින් බේරාගත් කාන්තාව වයස අවුරුදු 29 ක් වන රුසියානු ජාතික කාන්තාවකි.**

**02. ත්‍රීරෝද රථ සොරකමකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමග අත්අඩංගුවට - වත්තල පොලිස් ස්ථානය.**

2025.04.06 වන දින උදෑසන කාලයේ වත්තල පොලිස් වසමේ කදිරාන පාලම අසලදී වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබා ගෙන ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු එම ත්‍රීරෝද රථය ද සමග අත්අඩංගුවට ගෙන ඇත

**සැකකරු වයස අවුරුදු 27 ක් වන හැඳල, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදු කල විමශර්නයේදී මොහු 2025.04.04 වන දින වත්තල පොලිස් ස්ථානය වෙත වාතර්ා වී තිබූ ත්‍රීරෝද රථ සොරකමකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට හා අත්අඩංගුවට ගන්නා ලද ත්‍රීරෝද රථය ඉහත සොරකම් කරන ලද ත්‍රීරෝද රථය බවට අනාවරණය වී ඇත.

වත්තල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පුවරසන්කුලම් පොලිස් ස්ථානය.**

2025.04.06 වන අද දින සවස් කාලයේ පුවරසන්කුලම් පොලිස් වසමේ වේලන්කුලම් ප්‍රදේශයේදී පුවරසන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 35 ක් වන වේලන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුවරසන්කුලම් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**